**අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 මැයි 29 දින සභාපතිවරයාට වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | ප්‍රතිපාදන වෙන්කිරීම සඳහා කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු නිෂ්ශිතව ගණනය කිරීම ගැටළුසහගත වී තිබුණු නිසා අවසන් ගිණුම්වල ඇතුළත් කිරීම නොහැකි විය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසයේ ලැබී තිබූ මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය රු. 1,798,336 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් වශයෙන් නොපෙන්වා පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. එමනිසා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම මෙම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ සියළුම ආදායම්, ආදායම් ගිණුමට ඇතුළත් කළ යුතු වේ. | මුද්දර ගාස්තු ලබා ගන්නා වර්ෂයේ ආදායමට ගනු අතර, 2017 වර්ෂයේ මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය 2019 සැප්තැම්බර් මාසයේ ලැබුනු අතර, 2020 වර්ෂයේ ලැබියයුතු 2018 වර්ෂයට අදාල මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය 2019 නොවැම්බර් මාසයේ ලැබුනු හෙයින් 2018 වර්ෂයේ මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය ගිණුම් වර්ෂයේ ආදායමට ඇතුළත් නොකර 2020 වර්ෂයේ ආදායමට ඇතුළත් කිරීම සඳහා තැන්පත් ගිණුමට හරකරන ලදී. |

## 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 217 සහ 218 | ප්‍ර.ස.46 අනුව ඉඩම් සහ ගොඩනැගිලි ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | රීති අනුව ක්‍රියාකළ යුතු වේ. | ඉඩම් සහ ගොඩනැගිලි ලේඛනය දැනට පවත්වා ගෙන යනු ලැබේ. ඉදිරි විගණනයේදී විගණනයට ඉදිරිපත් කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,108,102 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,388,857 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| කුලී | 2,690,000 | 2,817,244 | 2,784,044 | 51,500 | 1,800,000 | 2,652,811 | 2,634,511 | 18,300 |
| බලපත්‍ර ගාස්තු | 400,000 | 439,150 | 439,150 | - | 335,000 | 348,900 | 348,900 | - |
| වෙනත් ආදායම් | 4,875,700 | 10,968,869 | 3,414,068 | 9,923,436 | 3,851,750 | 4,052,203 | 2,473,469 | 2,368,635 |
| | **7,965,700** | **14,225,263** | **6,637,262** | **9,923,436** | **5,986,750** | **7,053,914** | **5,456,880** | **2,386,935** |

## 2.2.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ නිවාස, කඩ සහ පුද්ගලික ආයතනවලින් එකතු කරන ඝන අපද්‍රව්‍ය සඳහා සේවා ගාස්තු ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය සඳහා සේවා ගාස්තු ගණනය කර අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභා බල ප්‍රදේශයේ නිවාස, කඩ සහ පුද්ගලික ආයතනවලින් එකතුවන ඝන අපද්‍රව්‍ය සඳහා සේවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කරනු ඇත. |

## 2.2.3 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් 2016 සිට 2019 දක්වා අයකර ගත් අතිරේක මුද්දර ගාස්තු ගණනය කර අයකර ගෙන නොතිබුණි. | අත්හැරුනු හිඟ මුද්දර ගාස්තු සඳහා ලියවිලි පිළියෙල කර අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල කාර්ය සම්බන්ධයෙන් රෙජිස්ටාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධවී දැනට 2018 සහ 2019 වර්ෂවලට අදාලව අතිරේකව අයකර ලත් මුද්දර ගාස්තු අප වෙත ලැබී ඇත. අනිකුත් වර්ෂවලට අදාලව අයවීම් ලබා ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් විධිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළයුතු වුවද, 2019 දෙසැම්බර් 31 දින දක්වා කරුණු 5 ක් සඳහා සකස්කරන ලද අතුරු ව්‍යවස්ථාවලට අනුමැතිය ලැබී නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සකස්කර අදාල අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | හෝටල්, බාබර්සාප්පු, විවාරක ස්ථාන, බේකරි සහ අන්තරායක වෙළඳ ආයතන ආදිය සඳහා අතුරු ව්‍යවස්ථා අළුතෙන් සකස්කර සහ එකඟතාවය අනුව අනුමැතිය සඳහා යවා ඇති අතර වෙනත් ආදායම් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සකස්කරන ලද අතුරු ව්‍යවස්ථා 05 ක් අනුව සභාව විසින් ක්‍රියාත්මක කළයුතුව තිබූ ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකරී සැලස්මක් සකස්කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලස්මක් පිළියෙල කළ යුතු වේ. | සකස්කරන ලද අතුරු ව්‍යවස්ථා 5 අනුව ක්‍රියාත්මක කළයුතු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම දැනට පිළියෙල කෙරෙමින් පවතී. |

**(ඇ) තිරිසාර සංවර්ධන ඉලක්ක**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතින්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයම ක්‍රියා කළ යුතු වුවත් මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ලඟා කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉලක්ක හඳුනාගෙන ඒවා මැණීම සඳහා දර්ශක ඇතිකර, එය ලඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කරගැනීම සඳහා ආයතනයේ ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සභා කාර්යාලය, පුස්තකාල, පොළ සහ මහජන ක්‍රිඩාංගනය යන ස්ථාන පිහිටුවා ඇති පර්චස් 505 ක ඉඩම් කැබැලි 07 ක් සඳහා ඔප්පු සභාව ලබාගෙන නොතිබුණි. | ඔප්පු ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | සමහර ඉඩම්වල පිඹුරුපත් ලැබුණු පසු ඒහි අයිතිය පවරා ගැනීමට කටයුතු කරනු ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| අනුමත සේවක සංඛ්‍යා සැලැස්ම තුල පුරප්පාඩු 07 ක් සහ අතිරික්ත 03 ක් පැවතුනි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | සභාවේ පවතින තනතුරු පුරප්පාඩු සම්බන්ධයෙන් ඒවා නිරාකරණය කර දෙන ලෙස ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපි යවා ඇත. |

**3.4 වාහන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු ක්‍රියාවිරහිත ට්‍රැක්ටර් රථ 03 ක් කාර්යාල පරිශ්‍රයේ නවතා තිබුණි. | අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත යුතු වේ. | අප සභාවේ රියදුරන් දෙදෙනකු පමණක් සිටින බැවින්, වාහන වල නටත්තු වියදම් සහ ඉන්ධන වියදම් අඩුකිරීම සඳහා අපගේ ප්‍රාදේශීය සභාවේ තිබෙන වාහන මාරුවෙන් මාරුවට ප්‍රයෝජනයට ගන්නා බැවින් මෙම වාහන නවත්වා අනිකුත් වාහන පාවිච්චි කරනු ලැබේ. |
| (ආ) | සභාව පරිහරණය කරන මහෙන්ද්‍රා ට්‍රැක්ටරය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | වෙනත් ආයතවලින් අපගේ සභාවට ලබා දී තිබූ මෙම ට්‍රැක්ටර් යන්ත්‍රයේ ලියවිලි අප වෙත භාර දී නොතිබුණි. දැනට එම ලියවිලි ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |